සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

මියුසියස් විද්‍යාලය - කොළඹ 7
Musaeus College - Colombo 07

වාර පරීක්ෂණය -2025 සැප්තැම්බර්
Term Test - September -2025

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)විභාගය , 2025
General Certificate of Education (Adv.Level) Examination,2025

ශ්‍රේණිය 13 Grade 13	ජීව විද්‍යාව I Biology I	09 S I	කාලය - පැය 2 යි Time - 2 hours

නම : .... පන්තිය : ....ඇතුලත්වීමේ අංකය : ....

වැදගත් :

* සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඇතුලත්වීමේ අංකය ලියන්න.
* 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1) , (2) ,(3) ,(4) ,(5) යන පිළිතුරුවලින් නිවැරදි හෝ ඉතාමත් ගැලපෙන හෝ පිළිතුර තෝරා ගෙන එය උත්තර පත්‍රයේ පසු පස දැක්වෙන උපදෙස් පරිදි අදාළ නිවැරදි අංකය මත කතිරයක් (x) යොදා දක්වන්න

(01) පොලිසැකරයිඩ සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න.

1) මහා අණුවන අතර හෙක්සෝසවල බහුඅවයවක වේ.
2) ඒකක අණු පෙප්ටයිඩ බන්ධන වලින් බැඳී පවතී. X
3) සමහර ආකාරවල C, H , O වලට අමතරව N හා P ද අඩංගු වේ. X
4) ව්‍යුහමය පොලිසැකරයිඩයක් වන සෙලියුලෝස් අතු බෙදී ඇත. X
5) බොහෝ ආකාර අද්‍රාව්‍ය වන අතර ශාක හා සත්ව දේහ තුළ සංචිතව පවතී.

(02) සෛල ඉන්ද්‍රියිකා සම්බන්ධ පහත දී ඇති ප්‍රකාශ අතුරින් සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ තෝරන්න.

A) ශාක සෛලවල ඔක්සිකරණ එන්සයිම අඩංගු ආශයිකා ලෙස පෙරොක්සිසෝම පවතී. ✓
B) ගොල්ගි උපකරණයේ ඇතුලත ට්‍රාන්ස් මුහුණතත් පිටත සිස් මුහුණතත් ලෙස පවතී. X
C) න්‍යෂ්ටිය මගින් DNA වල තොරතුරුවලට අනුව tRNA සංශ්ලේෂණය . ✓
D) බොහෝ සම්පූරක ප්‍රෝටීන ජලකාමී නාලිකා සහිත හිරයක් පටල ප්‍රෝටීන වේ. ✓

1) A හා B පමණි
2) B හා C පමණි
3) B හා D පමණි
4) C හි D පමණි
5) A, C හා D පමණි

Biology Kuppiya Telegram channel

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(03) C_3 හා C_4 ශාක අතර වෙනස්කම්වලින් සත්‍ය වනුයේ,

	C_3 ශාක	C_4 ශාක
1)	CO_2 දෙවරක් තිර කරයි .	CO_2 එක්වරක් තිර කරයි .
2)	CO_2 ප්‍රතිග්‍රාහකයා RuBP පමණක් වේ.	CO_2 ප්‍රතිග්‍රාහකයා PEP පමණක් වේ.
3)	ප්‍රථම ඵලය ඔක්සලෝ ඇසිටේට්ය.	ප්‍රථම ඵලය 3-පොස්පො ග්ලිසරේට්ය.
4)	පත්‍ර මධ්‍ය සෛල පමණක් ප්‍රභාසංස්ලේශනයට දායක වේ.	පත්‍ර මධ්‍ය සෛල හා කලාප කොපු සෛල යන දෙවර්ගයම දායක වේ.
5)	පත්‍ර මධ්‍ය සෛලවල හා කලාප කොපු සෛලවල හරිතලව ව්‍යුහ විද්‍යාත්මකව සමානයි .	පත්‍ර මධ්‍ය සෛලවල හා කලාප කොපු සෛලවල හරිතලව ව්‍යුහ විද්‍යාත්මකව වෙනස්ය.

(04) ප්ලාස්ම පටලය සම්බන්ධව සත්‍ය ප්‍රකාශය වනුයේ ,

1) සම්පූරක ප්‍රෝටීන යනු පටලයේ කොටසක් තුලින් පමණක් විනිවිද යන හෝ පටලය තුලින් සම්පූර්ණයෙන් විනිවිද යන ප්‍රෝටීන වේ.
2) පොස්පොලිපිඩ මහින් පටලයට විවිත්‍ර බවක් ලබා දේ.
3) ශාකවල පොස්පොලිපිඩ ස්තරයේ අභමුව කොලෙස්ටරෝල් අණු පිහිටයි . X
4) සිනිඳු අන්තඃප්ලාස්ම ජාලිකා ,සෛල පටල තුල කර්මාන්තශාලා ලෙස ක්‍රියා කරයි. X
5) තිර්යක් පටල ප්‍රෝටීන ජලභීතික වන අතර ඒ හරහා ධ්‍රැවීය අණුවලට ගමන් කල හැකිය . X

(05) ප්‍රභාසංස්ලේශනය පිළිබඳ නිවැරදි ප්‍රකාශනය තෝරන්න.

1) $NADP^+$ වැය කරමින් 1, 3 බිස්පොස්පොග්ලිසරේට් , ග්ලිසරැල්ඩිහයිඩ් 3- පොස්පේට් බවට පත්වේ. X
2) RuBP පුනර්ජනනය සඳහා අවශ්‍ය ඔක්සිහාරක බලය NADPH මහින් සැපයේ.
3) C_3 මාර්ගයේ සැදෙන ප්‍රථම කාබෝහයිඩ්‍රේටය පොස්පොර්නෝල් පයිරුවේට් වේ. X
4) සාමාන්‍ය තත්ව යටතේ ප්‍රභාසංස්ලේශණ ක්‍රියාවලියේ ප්‍රධාන සීමාකාර සාධකය උෂ්ණත්වයයි. X
5) ප්‍රභාසංස්ලේශණයේදී CO_2 ජලයේ ඇති හයිඩ්‍රජන් මහින් ඔක්සිහරණය වේ.

$CO_2 + H_2O \rightarrow C_6H_{12}O_6 + O_2$

(06) මෙම ප්‍රශ්නය පහත දී ඇති ශාක සෛල මත පදනම් වේ.

a) පාලක සෛල
b) කලාප කොපු සෛල
c) සාමාන්‍ය අපිචර්මීය සෛල
d) පත්‍ර මධ්‍ය සෛල
e) ස්ථූලකෝණාස්තර සෛල

ඉහත සෛල අතුරින් C_4 ශාකවල හරිතලව දරන සෛල වනුයේ,

1) a, b, d 2) a, d, e 3) b, c, e 4) b, d, e 5) a, c, d, e

Biology Kuppiya Telegram channel

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources
iexamhub

(07) එන්සයිම නිශේධක සම්බන්ධව ප්‍රකාශ කිහිපයක් පහත දී ඇත.

a. නිශේධක සැමවිටම එන්සයිමයට ස්ථිර ලෙස බැදේ.

b. විෂ, අප්‍රතිවර්ත්‍ය නිශේධක වර්ගයකි.

c. ක්ෂුද්‍ර ජීවීන්ට එරෙහිව භාවිතා වන ඖෂධ ප්‍රතිවර්ත්‍ය නිශේධක වේ.

d. තරඟකාරී නොවන නිශේධකවල හැඩය උපස්තරයේ හැඩයට සමාන වේ.

e. බොහෝ තරඟකාරී නිශේධක ප්‍රත්‍යාවර්ත නිශේධක වේ.

ඉහත ප්‍රකාශ අතුරින් සත්‍ය වන්නේ,

1) b හා c පමණි
2) c හා e පමණි
3) a, b හා c පමණි
4) b, c හා e පමණි
5) a, b, c හා d පමණි

(08) සිනිඳු පේශි, සරල ශල්කමය අපිච්ඡදය, සරල ඝනාකාර අපිච්ඡදය, තන්තුමය සම්බන්ධක පටකය යන පටක පිහිටා ඇති ස්ථානවලට උදාහරණ පිළිවෙලින් දැක්වෙන වරණය තෝරන්න.

1) ආන්ත්‍රික බිත්තිය, වෘක්ක නාලිකා, ශ්වසනාල ආස්තරණය, බන්ධනී.
2) ප්‍රතියෝජක දේහය, එන්ඩොකාඩියම, තයිරොයිඩ් ග්‍රන්ථිය, බන්ධරා
3) ධමනි බිත්ති, මුඛ කුහර ආස්තරණය, වෘක්ක නාලිකා, බන්ධරා
4) මයෝකාඩියම, රුධිර කේශනාලිකා, තයිරොයිඩ් ග්‍රන්ථිය, අන්තර් කශේරුක මඩල
5) මුත්‍රාශය, මුඛ කුහර ආස්තරණය, ආන්ත්‍රික ආස්තරණය, බන්ධනී

(09)

	ශාකය	ලක්ෂණය	කෘත්‍යය
A	*Cycas*	a) බීජ අණ්ඩප තුළ පිහිටීම	P) පරාග නාලය වර්ධනය
B	*Hibiscus*(වද)	b) විෂම බීජාණුකතාව	Q) අන්ධ දෙසට චලනය
C	*Cocos*	c) කශිකාධර ජන්මාණු	R) ආරක්ෂාව
D	*Pinus*	d) පරාග කණිකාවල විවර 3 ක් පැවතීම	S) බීජ ශාකවල විවිධත්වය දැක්වීම

නිවැරදි සංකලනය තෝරන්න:

1) A, b, R
2) C, d, P
3) B, d, P
4) D, a, R
5) B, c, S

(10) ශාක පත්‍රවල පුටිකා ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අසත්‍ය වනුයේ,

1) K^+ අයනවල පරිවහනයට ATP මගින් ශක්තිය සපයයි.
2) ඇබ්සිසික් අම්ලය පාලක සෛල වෙත ලභාවී පුටිකා වැසියාම උත්තේජනය කරවයි.
3) පාලක සෛලවල පිටත බිත්තිය ප්‍රත්‍යස්ථතාවයෙන් අඩුවීම පුටිකා විවෘත වීමට දායක වේ.
4) උත්ස්වේදනය අධික වන විට පුටිකා වැසියාම සිදුවේ.
5) පාලක සෛලවල සෙලියුලෝස් ඝනවීම් රටාව පුටිකා විවෘත වීමේ හා වැසීමේ යාන්ත්‍රණයට ඉවහල් වේ.

Biology/Kuppiya Telegram channel

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(11) ඇනිමාලියා රාජධානියේ වංශ 5 ක් සහ විවිධ වංශවලට ආවේණික ලක්ෂණ කිහිපයක් පහත දී ඇත. නිවැරදි වංශය හා ආවේණික ලක්ෂණය සහිත පිළිතුර තෝරන්න.

A - කෝඩේටා	P - දැවිකෙඳි
B - නෙමටෝඩා	Q - මැල්පීගිය නාලිකා
C - නිඩාරියා	R - මධ්‍ය ශ්ලේෂය
D - එකයිනොඩමේටා	S - දෘඪ උච්චර්මය
E - ආත්‍රපෝඩා	T - ශ්වාස රුක්
	U - පෘෂ්ඨීය ස්නායු රජ්ජුව
	V - හරිත ග්‍රන්ථි

1) D-T, E-V, A-U, B-S
2) A-Q, C-R, D-V, E-P
3) E-Q, D-S, A-R, B-S
4) B-Q, D-T, E-V, A-U
5) E-V, C-R, D-P, B-R

(12) පර්විත ප්‍රතිශක්තිය පිළිබඳ පහත දී ඇති ගැලපීම් අතුරින් වැරදි ගැලපීම තෝරන්න.

1) අක්‍රිය ප්‍රතිශක්තිය - බාහිරින් ලැබුණු ප්‍රතිදේහ, දේහය තුළ පවතින තෙක් ක්‍රියාත්මක වේ.
2) කෘතිම පර්විත අක්‍රිය ප්‍රතිශක්තිය - ක්ලෝනීකරණය කරන ලද ප්‍රතිදේහ මගින් ලබාදිය හැකිය.
3) කෘතිම පර්විත සක්‍රිය ප්‍රතිශක්තිය - බෙලහීන කරන ලද ජීවී පෝලියෝ වෛරසයක් එන්නත් කිරීමෙන් දේහය තුළ වෛරසයට එරෙහිව ප්‍රතිදේහ නිපදවීම කළ හැක.
4) ස්වභාවික පර්විත සක්‍රිය ප්‍රතිශක්තිය - ප්‍රථම වරට ස්වභාවිකව දේහයට ඇතුළුවන යම් රෝග කාරකයෙකුට ප්‍රතිචාර ලෙස ඇතිවේ.
5) සක්‍රිය ප්‍රතිශක්තිය - දේහය තුළ ප්‍රතිදේහජනකයට විරුද්ධව සයිටොටොක්සික් T සෛල නිපදවීමක් සිදු නොකරයි.

(13) මිනිසාගේ ශ්වසන යාමනය පිළිබඳව දී ඇති ප්‍රකාශය හා පැහැදිලි කිරීම නිවැරදි වන්නේ,

1) පටකවල ඉහළ CO_2 සාන්ද්‍රණය - රුධිර pH අගය පහළ යාමට හේතු වේ.
2) ශ්වසන වේගය හා ගැඹුර අඩුවීම - CO_2 බැහැර කරමින් pH අඩු කිරීමට දායක වේ.
3) අපිරේක ස්නායු පරපට - මස්තිෂ්කයට අයත් වැරෝලි සේතුවේ පිහිටයි.
4) O_2 සාන්ද්‍රණයේ ඉහළයාම - පුප්ඵුසීය ධමනිවල ඇති සංවේදක මගින් හඳුනාගනී.
5) පෙනහැලි ප්‍රමාණයට වඩා ප්‍රසාරණය වීම වැළැක්වීම - ප්‍රාශ්වාස ක්‍රියාවලිය නිශේධනය කිරීම.

(14) මානව ආහාර ජීරණ පද්ධතියට අයත් කොටස්වල කෘත්‍යයන් නිවැරදිව දක්වා ඇති ප්‍රකාශය තෝරන්න.

1) ආමාශයේ ප්‍රධාන සෛලවලින් H^+ හා Cl^- ශ්‍රාවය කරයි.
2) ආහාර ජීරණයේ වැඩි කොටසක් ග්‍රහණියාන්ත්‍රිකය තුළ සිදුවේ.
3) ආන්ත්‍රික ප්‍රෝටියේස් මගින් කුඩා පෙප්ටයිඩ, ඇමයිනෝ අම්ල බවට පත්වීම උත්ප්‍රේරණය කරයි.
4) ජීරණය නොවන ද්‍රව්‍ය ක්ෂුද්‍රජීවීන් මගින් පැසීම සඳහා උණ්ඩුක පුච්ඡය වැදගත් වේ.
5) බැහැර කරන තෙක් මළ ද්‍රව්‍ය ගබඩා කිරීමට මහාන්ත්‍රිකය දායක වේ.

Biology Kuppiya Telegram channel

www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(15) මානව සංවේදක ව්‍යුහ පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A) - රස ප්‍රතිග්‍රාහක සෛල ලෙස අපිච්ඡද සෛල විශේෂණය වී රසාංකුර ලෙස සංවිධානය වී ඇත.
B) - ආඝ්‍රාණ සංවේදක සෛල, නාස් කුහර පියස්සේ ඇති අපිච්ඡද සෛලවල ඇත.
C) - පීඩන ප්‍රතිග්‍රාහක ලෙස පැසිනියන් දේහාණු ගැඹුරු සමෙහි ඇත.
D) - මානව සංවේදක ප්‍රතිග්‍රාහක සැමවිටම ස්නායු පද්ධතියට සම්බන්ධව පවතී.

ඉහත ප්‍රකාශ අතුරින් නිවැරදි වන්නේ,

1) A හා B පමණි
2) B හා C පමණි
3) A, B හා C පමණි
4) A, C හා D පමණි
5) A, B, C හා D පමණ

(16) මානව අග්න්‍යාශයෙන් නිපදවනු ලබන ඉන්සියුලින් ක්‍රියාවට ප්‍රතිවිරුද්ධ ක්‍රියාවක් ඇති කරනු ලබන්නේ,

1) අධිවෘක්ක මජ්ජාවෙන් නිපදවන ඇඩ්‍රිනලින් .
2) අධිවෘක්ක බාහිකයෙන් නිපදවන කෝටිසෝල් .
3) තයිමස ග්‍රන්ථියෙන් නිපදවන තයිමොසින් .
4) වෘක්ක මගින් නිපදවන එරිත්‍රොපොයිටින්.
5) පැරා තයිරොයිඩ් මගින් නිපදවන පැරාතයිරොයිඩ් හෝමෝනය

(17) මානව පහළ ගාත්‍රය සම්බන්ධ පහත කවරක් නිවැරදිද?

1) දනිස් සන්ධිය සෑදීම සඳහා ඌර්වස්ථියේ විදූර කෙළවර අනුජංඝාස්ථිය හා දණිස්කටුව සමඟ සන්ධානය වේ.
2) ජංඝාස්ථිය පාර්ශ්විකව හා අනුජංඝාස්ථිය මධ්‍යස්ථවද පිහිටමින් කෙණ්ඩය සාදයි .
3) ජංඝාස්ථිය හා අනුජංඝාස්ථියේ විදූර කෙළවර පාද කූර්චාස්ථියක් සමඟ සන්ධානය වීමෙන් වළලුකර සන්ධිය සෑදී ඇත.
4) විලුඹේ සිට මහපටඟිල්ල දක්වා දිවෙන චක්‍රතා, තීරයක් චක්‍රවේ.
5) උකුල් සන්ධිය ආශ්‍රිතව සිදුකළ හැක්කේ භ්‍රමණ චලන පමණි.

(18) නිවැරදි සම්බන්ධතාවය තෝරන්න.

1) කෘතිම පර්ජිත අක්‍රිය ප්‍රතිශක්තිය හෙපටයිටිස් A වයිරසය ආසාදනය වීම මගින් ඇතිවේ.
2) කොවිඩ් එන්නත, ස්වභාවික පර්ජිත සක්‍රිය ප්‍රතිශක්තිය සඳහා උදාහරණයකි.
3) පෝලියෝ එන්නත , කෘතිම පර්ජිත සක්‍රිය ප්‍රතිශක්තිය සඳහා උදාහරණයකි.
4) කොලස්ට්‍රම් මගින් , කිරි බි වැඩෙන දරුවාට ලැබෙන්නේ ස්වභාවික පර්ජිත සක්‍රිය ප්‍රතිශක්තියකි.
5) BCG එන්නත කෘතිම පර්ජිත අක්‍රිය ප්‍රතිශක්තිය සඳහා උදාහරණයකි.

(19) වැරදි වගන්තිය තෝරන්න.

1) සෑම හිම් කාණ්ඩයක්ම ඔක්සිජන් අණු සමඟ ප්‍රත්‍යාවර්තව බැඳේ .
2) හිමොග්ලොබින් වල ප්‍රෝටීන කාණ්ඩය හා CO_2 එක්වී කාබැමයිනෝහිමොග්ලොබින් සෑදේ.
3) හිමොග්ලොබින්වල ඇති ඔක්සිජන් බන්ධක ස්ථානය සඳහා CO_2 තරඟ නොකරයි.
4) CO_2 රක්තාණු තුළට විසරණය වූ විට කාබොනික් ඇන්හයිඩ්‍රේස් එන්සයිමය මගින් CO_2 , ජලය සමඟ සම්බන්ධ වීම උත්ප්‍රේරණය කරයි.
5) නිදහස් වායු ලෙස අඩුම CO_2 ප්‍රමාණයක් ප්ලාස්මාවේ දියවී ඇත.

Biology Kuppiya Telegram channel

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(20) ලිංගික රෝග ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

A) ආහාර අරුචිය හා බර අඩුවීම .

B) පැලෝපීය නාල සැරවලින් පිරියාම හා වඳභාවය .

C) ලිංගික ප්‍රදේශ වටා වේදනාකාර කැසිල්ලක් සහිත වණ.

මේවායින් ගොනෝරියාව රෝගයේ ලක්ෂණ වන්නේ,

1) A පමණි
2) B පමණි
3) C පමණි
4) A හා C පමණි
5) B හා C පමණි

(21) පහත වගන්ති අතුරින් මානව වෘක්කයේ ව්‍යුහය පිළිබඳ සත්‍ය නොවන්නේ කුමක්ද?

1) මජ්ජාව වෘක්ක පිරමීඩවලින් සමන්විත වේ.
2) වෘක්කය තන්තුමය සම්බන්ධක පටකය මගින් නියමිත ස්ථානයේ රඳවා ඇත.
3) වෘක්කයේ බාහිකය ගුච්ඡිකා පිහිටන නිසා කණිකාමය ස්වරූපයක් ගෙන ඇත.
4) පිරමීඩවල අග්‍රස්ථ , වෘක්ක පිටිකා තුලින් වෘක්ක ශ්‍රෝණිය වෙතට යොමු වී ඇත.
5) බාහිකය හා මජ්ජා ප්‍රදේශවල බහිස්‍රාවී නාලිකා තදින් ඇසිර ඇත.

(22) බහුගුණකතාවය සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.

1) කොල්චිසින් මගින් බහුගුණතාවය කෘතිමව ප්‍රේරණය කල හැකිය.
2) බහුගුණ ශාක ඒවායේ ද්විගුණකයින්ට වඩා සාපේක්ෂව අඩු වර්ධක වේගයක් පෙන්වයි.
3) බහුගුණකතාවය පෘෂ්ඨවංශිකයන් තුල කිසිවිටකත් දක්නට නොලැබේ.
4) බහුගුණකතාවය නිසා විෂමයුග්මකතාවය වැඩිවේ.
5) බහුගුණකතාවය නිසා බෝග ශාකවල සරුභාවය අඩුවිය හැකිය.

(23) මිනිසාගේ ස්වයංසාධක ස්නායු පද්ධතිය පිළිබඳව නිවැරදි සංකලනය වනුයේ,

ප්‍රත්‍යානුවේගී කොටස	අනුවේගී කොටස
1) ස්නායු නිකුත්වන්නේ මොළයේ පාදස්ථයෙන් පමණි.	1) ස්නායු නිකුත් වන්නේ සුෂුම්නාවෙන් පමණි .
2) පූර්ව ගැංග්ලිය නියුරෝන සුෂුම්නාවේ ත්‍රිකාස්ථිය ප්‍රදේශයේ පමණක් ඇතිවේ.	2) පූර්ව ගැංග්ලිය නියුරෝන සුෂුම්නාවේ ග්‍රෛව හා කටි ප්‍රදේශවලින් ඇතිවේ.
3) පූර්ව ගැංග්ලිය නියුරෝන දිගුයි. පශ්ච ගැංග්ලිය නියුරෝන කෙටිය.	3) පූර්ව ගැංග්ලිය නියුරෝන කෙටිය. පශ්ච ගැංග්ලිය නියුරෝන දිගුය.
4) පීඩාකාර තත්ව හා සම්බන්ධයි.	4) උද්වේගකාර තත්ව හා සම්බන්ධයි.
5) ස්නායු සම්ප්‍රේෂකය නොඑපිනෙප්‍රින්ය .	5) ස්නායු සම්ප්‍රේෂකය ඇසිටයිල් කෝලින්ය.

(24) සිගරට් දුමෙහි ආශ්වාස වන නිකොටින් මගින් ,

1) පෙනහැලි පටකවල ඇති භක්ෂක සෛල ප්‍රමාණය වැඩි කරවයි.
2) පක්ෂ්ම නිසි ලෙස ක්‍රියාව නතර කරවයි.
3) රුධිරයේ ඔක්සිජන් පරිවහනය අඩු කරයි.
4) තාවකාලික රුධිර පීඩනය ඉහළ නංවයි.
5) ගර්තික පටක විනාශ කරයි.

Biology Kuppiya Telegram channel

(25) ප්‍රතිජීවක වර්ගය හා එහි ක්‍රියාකාරීත්වය වැරදි ලෙස ගලපා ඇත්තේ කවරක්ද?

1) පෙනිසිලින් - බැක්ටීරියා සෛල බිත්ති සංශ්ලේෂණය නිශේධනය කරයි.
2) එරිත්‍රොමයිසින් - බැක්ටීරියා DNA සංශ්ලේෂණය නිශේධනය කිරීම.
3) ඩැප්ටොමයිසින් - ප්ලාස්ම පටල කඩා බිඳ දැමීම
4) රිෆැම්පින් - බැක්ටීරියා RNA සංශ්ලේෂණය නිශේධනය කිරීම .
5) ටෙට්‍රාසයික්ලින් - බැක්ටීරියා ප්‍රෝටීන සංශ්ලේෂණය නිශේධනය කිරීම.

(26) ක්ෂුද්‍රජීවීන් කාර්මිකව යොදා ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් කුමන සම්බන්ධතාවය නිවැරදි වේද?

1) විටමින් B_{12} - *Propionibacterium* sp.
2) ස්ට්‍රෙප්ටොමයිසින් - *Streptococcus griseus*
3) සෙලියුලෝස් - *Aspergillus oryzae*
4) ඇසිටික් අම්ල පැසීම - *Azotobacter*
5) ආහාර පරිපූරක ලෙස - *Rhizopus* sp

(27) එක් ආකාරයකට වඩා වැඩි ගණනක් සමමිති අඩංගු වන වයිරසයකට උදාහරණයක් වන්නේ,

1) දුම්කොළ විචිත්‍ර වෛරසය.
2) ඇඩිනො වෛයිරසය .
3) හර්පීස් සිම්ප්ලෙක්ස් වෛරසය .
4) ජලභීතික වෛරසය .
5) බැක්ටීරියා භක්ෂක වෛරසය.

(28) දණිස් කටුව හැර මිනිසාගේ අපර ගාත්‍රයේ ඇති අස්ථි සංඛ්‍යාව ,

1) 22 2) 24 3) 25 4) 29 5) 30

(29) මෙන්ඩල්ගේ නියමවලට අනුව කිසියම් ගති ලක්ෂණ දෙකක් සඳහා AaBb ප්‍රවේණිදර්ශය සහිත ජීවීන් දෙදෙනෙකු අතර මුහුමකින් ඇතිවන ප්‍රජනිතයේ වෙනස් ප්‍රවේණිදර්ශ සංඛ්‍යාව වන්නේ,

1) 2 2) 3 3) 4 4) 9 5) 16

(30) ස්ත්‍රීන්ගේ ඩිම්භ මෝචනයේදී නිදහස් වන ද්විතියික අණ්ඩ සෛලයේ ඌනන විභාජනය නැවතී ඇත්තේ,

1) ප්‍රාක් කලාව I දිය
2) යෝග කලාව I දිය
3) ප්‍රාක් කලාව II දිය
4) යෝග කලාව II දිය
5) වියෝග කලාව I දිය

(31) ජෛව විවිධත්වයේ පාරිසරික සේවා අගයක් නොවන්නේ පහත සඳහන් ඒවායින් කුමක්ද?

1) දේශගුණය යාමනය කිරීම .
2) භූගත ජලය පුනරාරෝපනය කිරීම .
3) ජලය පිරිසිදු කිරීම .
4) ආපදා කළමනාකරණයට උපකාර වීම .
5) පාංශු ඛාදනය වැළැක්වීම .

Biology Kuppiya Telegram channel
iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(36) පාරිසරික නිකේතනය පිළිබඳව ප්‍රකාශන කිහිපයක් පහත දී ඇත.

a - කිසියම් ජීවී විශේෂයක් වාසය කරන භෞතික ප්‍රදේශයකි.

b - යම් කිසි ජීවියෙකු පරිසර පද්ධතිය තුළ ඉටුකරන කාර්යභාරයයි.

c - පරිසර පද්ධතිය තුළින් ශක්තිය ගලනයේදී ජීවියාගේ මෙහෙය නිකේතනයට ඇතුලත් වේ.

d - උෂ්ණත්වය , පාංශු තෙතමනය ආදී පාරිසරික තත්ව දරා ගැනීමේ හැකියාවන් ජීවියෙකුගේ නිකේතනයට අයත් වේ.

e - පරිසර පද්ධතියේ ජීවියා සතු නිශ්චිත ස්ථානයයි.

ඉහත ප්‍රකාශන වලින් නිවැරදි වන්නේ,

1) a, b හා c පමණි
2) b, c හා d පමණි
3) c, d හා e පමණි
4) b හා c පමණි
5) a හා e පමණි

(37) මිරිදිය විසිතුරු මත්ස්‍ය විශේෂ වලට සුලභව වැළඳෙන රෝග පිළිබඳ නිවැරදි ගැළපුම වන්නේ,

1) කොලම්නාරිස් - දිලීර
2) බාහිර දිලීර ආසාදන - බැක්ටීරියා
3) චර්ම ප්‍රදාහය - ඒක සෛලික පරපෝෂිතයන්
4) කරමල් කුණුවීම - දිලීර
5) සුදු පුල්ලි රෝගය - අනිවාර්ය පරපෝෂිතයන්

(38) බියෝම පිළිබඳ නිවැරදි වගන්තිය තෝරන්න.

1) නිවර්තන වියළි වනාන්තරවල 4000mm වලට වඩා වැඩි වර්ෂාපතනයක් ඇත.
2) සවානා තෘණ භූමි , උස් තෘණ වැස්මකින් පමණක් සමන්විත වේ.
3) වැපරාල් ශාකවල ගැඹුරු මුල් ඇත.
4) සෞම්‍ය කලාපික පලල් පත්‍ර වනාන්තරවල ස්ථරගතවනය දැකිය හැක.
5) පෘථිවියේ භූමි ප්‍රමාණයෙන් 30% ක් පමණ අයත් වන්නේ තුන්ද්‍ර බියෝමයටයි.

(39) පාරිසරික පිරමිඩ සම්බන්ධව නිවැරදි ප්‍රතිචාරය කුමක්ද?

1) පරිසර පද්ධතියෙන් පරිසර පද්ධතියට සංඛ්‍යා පිරමිඩය වෙනස් නොවේ.
2) පාරිසරික පිරමිඩයක ඉහළම පෝෂී මට්ටම ආහාර දාමයේ මුදුනේ ඇත.
3) ශක්ති පිරමිඩයක ඉහළම පොෂී මට්ටමේ වැඩිම ශක්තියක් ඇත.
4) සැමවිටම සංඛ්‍යා පිරමිඩයක ඒකෙකයින් සංඛ්‍යාව පහළ සිට ඉහළ පෝෂී මට්ටම දක්වා යන විට ක්‍රමයෙන් අඩුවේ
5) සැමවිටම ජෛව ස්කන්ධ පිරමිඩය උඩුකුරු වේ.

(40) නැනෝ තාක්ෂණයේ භාවිතයන් පිළිබඳ නිවැරදි සම්බන්ධතාවය වන්නේ,

1) TiO_2 - ශල්‍යාගාර තුළදී ක්ෂුද්‍රජීවීන් ඇතුළුවීම වැළැක්වීම.
2) සිල්වර් නැනෝ ෂෙල්ස් - ජෛව ප්‍රතිබිම්බනය
3) නැනෝ වට්ටෝරුගත ලිපසෝම - වේදනාවට ප්‍රතිකාර කිරීමට
4) රන් නැනෝ පෙරහන් - SARS රෝගීන් පරීක්ෂා කිරීමට
5) සපත් ඖෂධ - සැඩුණු අස්ථි ප්‍රතිස්ථාපනයට යොදා ගනී.

Biology Kuppiya Telegram channel

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

- ප්‍රශ්න අංක 41 - 50 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රතිචාර අතුරෙන් එකක් හෝ කිහිපයක් නිවැරදි ය. කවර ප්‍රතිචාරය / ප්‍රතිචා නිවැරදිද යන්න විනිශ්චය කර නිවැරදි අංකය තෝරන්න.

1	2	3	4	5
(A), (B), (D) නිවැරදිය.	(A),(C) ,(D) නිවැරදිය.	(A),(B) නිවැරදිය.	(C), (D) නිවැරදිය .	වෙනත් ප්‍රතිචාර එකක් හෝ කිහිපයක් නිවැරදිය.

(41) ඇබ්සිසික් අම්ලය ,

A) බීජ සුප්තතාවය නිශේධනය කරයි .

B) පුටිකා විවෘත වීම දිරිගන්වයි.

C) ශාක මුල් හා පත්‍ර මගින් නිපදවේ.

D) පත්‍ර වෘද්ධතාව දිරිගන්වයි.

E) මූලකේශ වර්ධනය දිරිගන්වයි.

(42) නිවැරදි වගන්තිය / වගන්ති වන්නේ,

A) ලවණකාමී බැක්ටීරියාවන්ගේ සෛල බිත්ති තුල පෙප්ටිඩොග්ලයිකැන් පවතී.

B) *Acetobacter, Clostridium, Nostoc* යනු N_2 තිර කරන බැක්ටීරියාවන්ය.

C) *Paramecium* සහ *Amoeba* යන කාණ්ඩ දෙකෙහිම ආහාර රික්තක අඩංගු වේ.

D) *Sargassum* වල වායු පිරුණු බල්බයක හැඩැති උත්ප්ලාවක, තලයට ආධාරකයක් සපයයි.

E) *Ulva, Gelidium,* Diatom යන ඇල්ගාවන් කරදිය වාසීන් පමණක් වේ.

43) මානව කංකාල පද්ධතිය හා සම්බන්ධ සංකූලතා හා අසාමාන්‍යතා පිළිබඳව සත්‍ය වගන්තිය / වගන්ති වන්නේ,

A) අස්ථිවල ප්‍රදාහික නොවන අස්ථි ක්ෂය වී යැම අස්ථි වෛවර්වය නම් වේ.

B) මඩල ලිස්සීම යනු අන්තර් කශේරුක මඩලේ බාහිර කොටස අභ්‍යන්තරයෙන් ඇති මුදුව තුළින් පිටතට නෙරා යාමයි.

C) ඔස්ටියෝආතරයිටිස් සඳහා අවදානම් සාධක ලෙස ස්ථූලතා දැක්විය හැක.

D) අස්ථි වෛවර්වය සඳහා හේතුවක් ලෙස පාරසරික සාධක දැක්විය හැකිය.

E) ඔස්ටියෝපොරෝසිස් තත්වයේදී සන්ධිවල චලන සීමාකාර වේ.

44) ක්ලයින්ෆෙල්ටර් සහලක්ෂණය පිළිබඳ සත්‍ය ප්‍රකාශය / ප්‍රකාශ වන්නේ ,

A) XXY වර්ණදේහ දරන්නන් ලිංගික නිසරු පුරුෂයන්ය.

B) XO දරන ස්ත්‍රීන් ලිංගික පරිණතිය සිදු නොකරයි.

C) ත්‍රිදේහ ස්ත්‍රීන් XXX වර්ණදේහ දරණ අතර ඔවුන් සරු ස්ත්‍රීන්ය.

D) XXY දරන පුරුෂයින්ගේ විශාල වූ පියයුරු වැනි ස්ත්‍රී ලක්ෂණ පවතී.

E) ත්‍රිදේහ පුරුෂයන් YYY ප්‍රවේණි දර්ශය දරයි.

Biology Kuppiya Telegram channel

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

(45) රතු දත්ත පොතට අනුව EX, CR, EN, VU යන අර්ථ දැක්වීමට අදාල උදාහරණ නිවැරදි පිළිවෙලින් දැක්වෙන ප්‍රතිචාරය / ප්‍රතිචාර වන්නේ,

A) යෝධ ඉබ්බා, වෙසක් ඕකිඩ්, බටර් කප්, මහමඩු .
B) ඩෝඩෝ, ඇතා, දුම්බර ගල්පර දියමැඩියා, පුංචි ලේනා .
C) ලෝම මැමත්, මහමඩු, ඇතා, බටර් කප් .
D) ඩෝඩෝ, දුම්බර ගල්පර දියමැඩියා, වෙසක් ඕකිඩ්, පුංචි ලේනා .
E) *Crudia zeylanica*, පුංචි ලේනා, මහමඩු, යෝධ ඉබ්බා.

(46) වානිජමය වශයෙන් එන්සයිමයක් හෝ ප්‍රතිජීවකයක් නිෂ්පාදනයට යොදාගන්නා, බැක්ටීරියා සඳහන් වන්නේ පහත සඳහන් කවරකද? / කවර ඒවායේද?

A) *Bacillus subtilis*
B) *Streptomyces griseus*
C) *Pseudomonas* sp
D) *Aspergillus niger*
E) *Saccharomyces* sp

(47) දිලීරවල අලිංගික ප්‍රජනනය සම්බන්ධ නිවැරදි සංකලන/සංකලනය තෝරන්න.

A) *Mucor* - අන්තර්ජනා, බීජානුධානි බීජානු
B) *Penicillium* - බහිර්ජනා, කොනිඩි බීජානු
C) *Allomyces* - බහිර්ජනා, චල බීජානු
D) *Aspergillus* - අන්තර්ජනා, අස්ක බීජානු
E) *Agaricus* - බහිර්ජනා, බැසිඩි බීජානු

(48) කෘෂිකර්මාන්තයේදී GMO වල භාවිතය පිළිබඳ නිවැරදි ප්‍රතිචාර කුමක්ද?

A) විටමින් A වලින් පොහොසත් රන් සහල් ඉහළ පෝෂන අගයක් සහිත GM භෝගයකි.
B) කපු, බඩඉරිඟු, කැනෝලා, අර්තාපල් වඩාත් පුළුල්ව වගාකරන පළිබෝධ ප්‍රතිරෝධී GM ශාක සඳහා උදාහරණ වේ.
C) නියං ප්‍රතිරෝධී ශාකවන අර්තාපල් හා සෝයාබෝංචි පමණක් වානිජකරණයට ලක්කර ඇත.
D) බ්‍රොමොක්සිනෝල් වල්නාශකයට ඔරොත්තු දීමට විකරණය කල කපු BXN කපු ශාකය ලෙස හැඳින්වේ.
E) Bt විෂ ක්ෂීරපායීන්ට හානිකර වන නිසා මිනිස් පරිභෝජනයට සුරක්ෂිත නොවේ.

(49) සංවේදී ප්‍රතිග්‍රාහක පිළිබඳ නිවැරදි සංකලන / සංකලනය තෝරන්න.

A) තාප ප්‍රතිග්‍රාහක - හයිපොතැලමස - ගැඹුරු දේහ උෂ්ණත්වය හඳුනා ගනී.
B) ක්‍රවුස් අන්ත බල්බ - සමේ චර්මය - සිසිලස හඳුනා ගනී .
C) පැසිනියන් දේහාණු - සමේ ඉහළ ස්ථරය - කම්පන හඳුනා ගනී .
D) රෆිනි දේහාණු - සමේ අපිචර්මය - උණුසුම හඳුනා ගනී.
E) මර්කල් මඩල - සමේ චර්මය - සුඛා පීඩන හඳුනා ගනී.

(50) අධිපරිභෝජනය නිසා තර්ජනයට ලක්ව ඇති ශාක විශේෂයක් / විශේෂ වනුයේ,

A) *Salacia reticulata*
B) *Diospyros ebenum*
C) *Lantana camara*
D) *Acrostichum aureus* (කැරන් කොකු)
E) *Terminalia bellirica* (බුළු)

Biology Kuppiya Telegram channel

iexamhub
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

මියුසියස් විද්‍යාලය - කොළඹ 7
Musaeus College - Colombo 07

වාර පරීක්ෂණය -2025 සැප්තැම්බර්
Term Test - September -2025

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ)විභාගය , 2025
General Certificate of Education (Adv.Level) Examination,2025

ශ්‍රේණිය 13 Grade 13	ජීව විද්‍යාව II Biology II	09	S	II

B කොටස - රචනා ප්‍රශ්න

උපදෙස්

- ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න .
- අවශ්‍ය තැන්හිදී නම්කරන ලද පැහැදිලි රූප සටහන් දෙන්න.
  (එක් එක් ප්‍රශ්නය සඳහා නියමිත ලකුණු ප්‍රමාණය 150කි.)

(01) a) එන්සයිම යනු මොනවාද? පැහැදිලි කරන්න.

b) එන්සයිමවල ලාක්ෂණික ගුණ කෙටියෙන් සඳහන් කරන්න.

c) තරඟකාරී හා තරඟකාරී නොවන නිශේධක යනු මොනවාද? ඒවායේ ක්‍රියාකාරීත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

(02) a) දිලීර රාජධානියේ ලාක්ෂණික ලක්ෂණ කෙටියෙන් සඳහන් කරන්න.

b) ප්‍රභාසංශ්ලේෂනයේ C_4 පථය කෙටියෙන් පැහැදිලි කරන්න.

(03) a) සංවේදක ප්‍රතිග්‍රාහකවල මූලික ලක්ෂණ කෙටියෙන් පැහැදිලි කරන්න.

b) තාප ප්‍රතිග්‍රාහක හා ස්පර්ශ ප්‍රතිග්‍රාහක කෙටියෙන් විස්තර කරන්න.

(04) a) හාඩි වයින්බර්ග් සමතුලිතතාවය පවත්වා ගැනීම සඳහා අවශ්‍ය තත්ව කෙටියෙන් පැහැදිලි කරන්න.

b) අසම්පූර්ණ ප්‍රමුඛතාවය හා බහුඇලීලතාවය කෙටියෙන් පැහැදිලි කරන්න.

(05) නයිට්‍රජන් චක්‍රයට අයත් ප්‍රධාන පියවර කෙටියෙන් විස්තර කරන්න.

(06) කෙටි සටහන් ලියන්න.

a) පටක රෝපනයේ මූලධර්ම හා එහි වැදගත්කම .

b) මානව ශුක්‍රාණුජනන ක්‍රියාවලිය .

c) පළමු ත්‍රෛමාසිකය තුළ මානව භ්‍රෑණයේ සිදුවන ප්‍රධාන වෙනස්වීම්.

Biology Kuppiya Telegram channel
www.iexamhub.com
Your Trusted Partner for Exam Success
Past Papers · Model Answers · Study Resources